# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

# 12 ශ්‍රේණිය

# 1 පාඩම

## සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා විකාශය

**නිපුණතා මට්ටම - 1.1 ශාස්ත්‍රීය විෂයයක් ලෙස සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය, විකාශය හා ඉගෙනීමෙහි වැදගත්කම හඳුනා ගෙන ඉදිරිපත් කරයි.**

පුද්ගල අන්තර් සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා සෑම පුද්ගලයෙකුට ම සන්නිවේදනය අත්‍යවශ්‍ය වෙයි. එබැවින් සන්නිවේදනය අත්‍යවශ්‍ය මානවීය ක්‍රියාවලියක් ලෙස හඳුන්වනු ලැබේ.

සන්නිවේදනය යන්නෙහි සරල අර්ථය වන්නේ හැඟීම්, දැනීම්, අදහස් සහ දැනුම යනාදිය හුවමාරු කර ගැනීමයි.

අතීතයේ විසූ මිනිසුන් විවිධ ශබ්ද, සංඥා, සංකේත භාවිතයෙන් සරල අදහස් හුවමාරු කරගත් අතර වර්තමානය වන විට ජනමාධ්‍ය සහ අංකිත සන්නිවේදන තාක්ෂණ මෙවලම් ඔස්සේ සිදු කරනු ලබන තොරතුරු හුවමාරුව දක්වා සන්නිවේදන ක්ෂේත්‍රය පුළුල් වී ඇත. මේ නිසා ගෝලීය පවුල යන යෙදුම භාවිතයට ගැනීමට හේතු කාරක වන තරමට ම මානව අන්තර් සම්බන්ධතා සමීප කරවීමට සන්නිවේදනය අද වන විට වර්ධනය වී තිබේ.

සන්නිවේදන ක්‍රියාවලියේ වර්ධනයත් සමග ජනමාධ්‍ය ඇතුළු විවිධ සන්නිවේදන මාධ්‍ය හරහා සිදුවන අසීමාන්තික තොරතුරු ජනනය, හුවමාරුව හා තොරතුරු ව්‍යාප්තිය තනි තනි පුද්ගලයාගේ මනස හා චර්යාවන් කෙරෙහි වගේම පුද්ගලයාගේ අන්තර් සම්බන්ධතා කෙරෙහිත් අවසානයේ සමස්ත සමාජය කෙරෙහිත් විශාල බලපෑමක් ඇති කරනු ලබයි.මෙම බලපෑම යහපත් මෙන්ම අයහපත් බලපෑමක් ද විය හැකියි. ඒ කෙසේ නමුත් වර්තමාන සමාජයේ ජීවත්වෙන පුද්ගලයකුට තොරතුරු පරිහරණය කිරීමෙන් තොරව හුදකලා පුද්ගලයකු ලෙස ජීවත්වීම කළ නොහැකිය. මිනිසා සමාජීය සත්ත්වයකු නිසා ඔහුට තොරතුරු පරිහරණයෙන් වැළකී සිටීම හෝ වළකා තැබීම කළ නොහැකිය. පුද්ගලයාගේ හා සමාජයේ ප්‍රගමනයට අවශ්‍ය තොරතුරු ලබා ගත යුතු ය. මේ සඳහා අවශ්‍ය වන්නේ මාධ්‍ය ඔස්සේ ලබා දෙන තොරතුරු තෝරා බේරා ගෙන පරිහරණය කිරීමයි. මාධ්‍ය මායාව හා යථාර්ථය වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමට ශක්තිය ඇති කරන පුද්ගලයාට අත්‍යවශ්‍ය වන මාධ්‍ය සාක්ෂරතාව සහ විචාරශීලී ග්‍රාහකයන් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය දැනුමෙන් පුද්ගලයා සන්නද්ධ විය යුතු ය.

1982 වසරේ දී යුනෙස්කෝ සංවිධානය **ගෲන්වල්ඩ් ප්‍රකාශනය (Grunwald Declaratio)** විසින් එහි සමුළුවාර කිහිපයකදී ම මාධ්‍යයේ අහිතකර බලපෑමෙන් ළමා හා තරුණ පරපුර මුදවා ගත යුතු බව දක්වන ලදී. එහි දී මාධ්‍ය සාක්ෂරතාව හා විචාරශීලී ලෙස මාධ්‍ය පරිහරණය කිරීම මෙන් ම නිර්මාණශීලී චින්තනයෙන් දරුවන් බලසම්පන්න කළ යුතු බව අවධාරණය කරන ලදි. පෙර පාසල් අවධියේ සිට මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බවට යුනෙස්කෝ සංවිධානය නිර්දේශ කර සිටියේ ද ඒ අනුව යි. (https://www.scribd.com/document/114270776/Grunwald-Declaration-on-Media-Education)

## සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා විකාශය

ප්‍රාථමික සමාජයන්හි විසූ ජනයා සිය සරල ජීවන අවශ්‍යතා ඉටුකර ගැනීම කර ගැනීම සඳහා විවිධ සංඥා, සංකේත භාවිත කරමින් ආරම්භ කළ අදහස් ප්‍රකාශනය වර්තමානය වන විට දියුණු සන්නිවේදන තාක්ෂණික මෙවලම් ඔස්සේ සිදුවන ඉතා සංකීර්ණ ක්‍රියාදාමයක් බවට පත්ව තිබේ.

සන්නිවේදන ක්ෂේත්‍රයෙහි ඇති වූ තාක්ෂණික දියුණුවත් ජන මාධ්‍යයන්ගේ වර්ධනය මෙන්ම මාධ්‍ය මගින් සමාජය වෙත කරන ලද බලපෑමේ ස්වභාවය යන කරුණු සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ස්වාධීන විෂයයක් ලෙස වර්ධනය වීමට පාදක විය. එසේම මේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කිරීමටත් මෙම තත්ත්වය හේතු විය.

**සන්නිවේදන අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ වන්නේ,**

**මානව අත්දැකීම්වල කේන්ද්‍රීය සාධකය ලෙස සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ හැදෑරීමයි.**

**මානව අත්දැකීම් යන්නට,**

**සන්දේශ නිර්මාණය,හුවමාරු කර ගැනීම,ඒවා අර්ථකථනය කිරීමේ දී ජනතාව හැසිරෙන හා ක්‍රියා කරන ආකාරය කෙසේ ද යන්න අවබෝධ කරගැනීම ඇතුළත් වේ .**

සන්නිවේදනය යන්න මිනිසාගේ ආරම්භය තෙක් දිවෙන ක්‍රියාවලියක් වුවත් එය ශාස්ත්‍රීය විෂයයක් ලෙස අධ්‍යයනය කිරීම කෙරෙහි ලෝකයේ අවධානය යොමු වන්නේ 20 වන සියවසේ මුල් භාගයේ දී පමණ ය. කාර්මික විප්ලවය, පළමුවන ලෝක යුද්ධය හා දෙවන ලෝක යුද්ධය හේතුවෙන් සන්නිවේදන තාක්ෂණයේ සිදු වූ ශීඝ්‍ර දියුණුව, ජනමාධ්‍ය බිහි වීම, වර්ධනය හා ව්‍යාප්තිය කෙරෙහි බලපෑම් කළ අතර මෙම තත්ත්වය සන්නිවේදන විෂය පිළිබඳ අධ්‍යයනය කිරීමේ උනන්දුව හා අවශ්‍යතාව ඉහළ නැංවීය.

ලෝක යුද්ධ අවසන් වීමෙන් පසු යුද්ධ තොරතුරු වාර්තා කිරීම හා හුවමාරු කිරීම සඳහා භාවිත කළ මාධ්‍ය ඉන් අනතුරුව ජනතාව වෙනුවෙන් විනෝදාස්වාදය හා තොරතුරු සම්පාදනය කිරීම සඳහා යොදා ගන්නා ලදී. යුද්ධයෙන් පීඩාවට පත්ව සිටි ජනතාවගේ බිඳ වැටුණු මානසිකත්වය ඉලක්ක කර ගනිමින් මාධ්‍ය ඔස්සේ සරල විනෝදය ගෙන දෙන ත්‍රාසය, භීතිය, වීරත්වය හා ලිංගිකත්වය මතු කරන ආකාරයේ ටෙලිනාට්‍ය, චිත්‍රපට, පුවත්පත් හා ගීත ආදිය බහුල ලෙස භාවිතයට යොදා ගනු ලැබිණි. ඒ

අනුව වාණිජ පරමාර්ථ මෙන් ම බලය ලබා ගැනීම හා  බලය තහවුරු කර ගැනීමේ අපේක්ෂාවන් පෙරදැරි කර ගෙන ජනමාධ්‍ය භාවිත කිරීම සඳහා එකල මාධ්‍ය හිමිකරුවන් හා දේශපාලන නායකයන් කටයුතු කරන ලදී. මාධ්‍ය මගින් සමාජය වෙත එල්ල කරන ලද තියුණු බලපෑම සන්නිවේදන ක්ෂේත්‍රය පිළිබඳ ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යනය කිරීම සඳහා විද්වතුන් පොලඹවනු ලැබීය.

සන්නිවේදන විෂය "සන්නිවේදන අධ්‍යයනය" (Communication Studies) නමින් ස්වාධීන විෂයයක් ලෙස හැඳින්වීමට පෙර එය ප්‍රධාන වශයෙන් විෂයයන් තුනක් වන,

**1. මනෝ විද්‍යාව**

**2. සමාජ විද්‍යාව**


**3. දේශපාලන විද්‍යාව යන ශික්ෂණවේදයන්හි අන්තර්ගත විය.**


| | | |
|---|---|---|
| සමාජ විද්‍යා ක්ෂේත්‍රය | චාර්ල්ස් හෝර්ටන් කුලී | සමාජ සංවිධානය( 1909 ) |
| දේශපාලන විද්‍යා ක්ෂේත්‍රය | වෝල්ටර් ලිප්මාන් | ජනමතය( 1922 ) |
| අධ්‍යාපන විද්‍යා ක්ෂේත්‍රය | ජෝන් ඩුවි | ජනතාව හා ඔවුන්ගේ ගැටලු (1927 ) |



චාල්ස් කුලි (1864-1929)
Charles Horton Cooley


වෝල්ටර් ලිප්මාන් (1889-1974)
Walter Lippmann


ජෝන් ඩුවි (1859-1952)
John Dewey




මෙම විද්වතුන්ගේ අදහස් හා පර්යේෂණ අධ්‍යයන විසින් සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ශාස්ත්‍රීය විෂයයක් ලෙස වර්තමාන තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය පදනම සකස් විය. මානව සම්බන්ධතා පවත්වා ගැනීමේ හා හා වර්ධනය කිරීමේ යාන්ත්‍රණය සන්නිවේදනය බව චාල්ස් කුලී විග්‍රහ කරන අතර මෙම විද්වතුන් තිදෙනා ම පුද්ගලයාගේ සමාජ ජීවිතයේ වැදගත්ම හා කේන්ද්‍රීය සාධකය සන්නිවේදනය ලෙස හඳුන්වා දෙයි.

වෙනස් වෙන හා දියුණු වන මාධ්‍ය තාක්ෂණය,සංස්කෘතිය කෙරෙහි ඇති කරන බලපෑම සහ සන්නිවේදනය, ප්‍රජාතන්ත්‍රවාදය හා ප්‍රජාව යන කරුණු අතර ඇති සම්බන්ධතාවෙන් මතුවන සමාජ ගැටලු පිළිබඳ මෙම විද්වතුන් තවදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත. මෙම අදහස් සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස අධ්‍යයනය කිරීමට අවශ්‍ය පදනම සකස් කරන ලදී.

1933 වසරේ සිට 1945 පමණ දක්වා ජර්මනියේ ක්‍රියාත්මක වූ ඇඩොල්ෆ් හිට්ලර්ගේ ඒකාධිපති පාලනය යටතේ විශ්වවිද්‍යාලවලින් පිටමං කරනු ලැබූ විද්වතුන් විශාල ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපදයට සංක්‍රමණය විය. ඔවුන් ඇමෙරිකානු විශ්ව විද්‍යාල කේන්ද්‍ර කර ගනිමින් සන්නිවේදන ක්ෂේත්‍රය පිළිබඳ විවිධ ශාස්ත්‍රීය අධ්‍යයනයන්හි නිරත විය.

## සන්නිවේදන අධ්‍යයනයෙහි ශාස්ත්‍රීය වර්ධනයට අවශ්‍ය පදනම සකස් කරන ලද විද්වතුන්


හැරල්ඩ් ඩී. ලැස්වෙල්
(1902-1978)
Harold D. Lasswell


කර්ට් ලෙවින්
(1890-1947)
Kurt Lewin


පෝල් එෆ්. ලැසාස්ෆෙල්ඩ්
(1901-1976)
Paul F. Lazarsfeld


කාර්ල් අයිවර් හව්ලන්ඩ්
(1912-1961)
Carl Iver Hoyland


විල්බර් ශ්‍රාම්
(1907-1987)
Wilber Schranm


ජෝර්ජ් ගාබ්නර්
(1919-2005)
George Gerbner


වොරන් වීවර්
(1894-1978)
Warren Weaver


ක්ලෝඩ් ශැනන්
(1916-2001)
Claude Shannon

## විල්බර් ශ්‍රාම්



විල්බර් ශ්‍රාම් සමාජ විද්‍යාඥයෙක් වුවත් සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ අධ්‍යයනය සඳහා ඔහු ප්‍රබල ලෙස දායක විය. 1907 දී ඇමෙරිකාවේ උපත ලැබූ විල්බර් ශ්‍රාම් විවිධ ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයවලට යොමු වූ අයෙකි. 1928 දී ගෞරව උපාධිය ලබාගත් විල්බර් ශ්‍රාම් පසුව හාර්වඩ් විශ්වවිද්‍යාලයෙන් ආචාර්ය උපාධිය ද හිමිකර ගත්තේය. ඔහු ඇමෙරිකාවේ දත්ත හා තොරතුරු කාර්යාලයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේය. පශ්චාත් යුද සමයේ දී මහජනයා තුළ විශ්වසනීය මත ගොඩනැගීම සඳහා අධ්‍යාපනික සන්නිවේදනයේ අවශ්‍යතාව අවධාරණය කළ ප්‍රධාන සන්නිවේදන විශේෂඥයකු ලෙස විල්බර් ශ්‍රාම් ප්‍රචලිත විය. ඉලිනොයිස් විශ්වවිද්‍යාලය තුළ ඇරඹෙන සන්නිවේදනය සඳහා වන ආයතනය ඇරඹෙන්නේ විල්බර් ශ්‍රාම්ගේ මූලිකත්වයෙනි. ඉලිනොයිස් විශ්වවිද්‍යාලය සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ඉගැන්වීම ආරම්භ කළ ලොව ප්‍රථම විශ්ව විශ්වවිද්‍යාලය බවට පත් විය. සන්නිවේදන නිර්වචන, සන්නිවේදන ආකෘති, සන්නිවේදන ආකල්ප, සන්නිවේදන සංවර්ධනය මෙන් ම විෂය තුළ ඉගැන්වෙන කරුණු රාශියක් විල්බර් ශ්‍රාම් මහාචාර්යවරයා ඉදිරිපත් කර ඇත. ඔහු ග්‍රන්ථ විසි පහකට වැඩි සංඛ්‍යාවක් රචනා කර ඇති අතර වඩාත් ප්‍රචලිත වූ ලිපි හතළිහක් පමණ ප්‍රකාශයට පත් කර ඇත. විල්බර් ශ්‍රාම්ගේ අවසන් ග්‍රන්ථය වූයේ " The Story of Human Communication " ග්‍රන්ථයයි. සන්නිවේදන විෂය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ආයතන ගත කිරීම සඳහා විල්බර් ශ්‍රාම් විශාල කාර්යභාරයක් සිදු කර ඇති නිසාම සන්නිවේදනයේ පියා ලෙස ඔහු සියලු දෙනාගේ ගෞරවයට පාත්‍ර වී ඇත. 1954 දී විල්බර් ශ්‍රාම් ඉදිරිපත් කරන ලද සන්නිවේදන ආකෘතිය සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ වඩාත් සාකච්ඡාවට ලක් වූවකි. (https://en.m.wikipedia.org/wiki/Wilbur_Schramm)

(https://www.britannica.com/biography/Wilbur-Schramm)



හැරල්ඩ් ඩී. ලැස්වෙල් ඇමෙරිකාවේ දේශපාලන විද්‍යාඥයෙකි. ඇමෙරිකාව දේශපාලන සංගමයේ සභාපතිවරයා ලෙස ද ඔහු කටයුතු කර තිබේ. 1902 දී උපත ලැබූ ලැස්වෙල් ඇමෙරිකාවේ දේශපාලන විද්‍යා ක්ෂේත්‍රයේ කීර්තිධර විද්වතෙකු බවට පත්ව සිටියේය. චිකාගෝ සරසවියෙන් ආචාර්ය උපාධිය හිමි කර ගත් ඔහු විශ්වවිද්‍යාල ආචාර්යවරයකු ලෙස කටයුතු කර ඇත.


දේශපාලන විද්‍යාව පිළිබඳ කීර්තිධර මහාචාර්යවරයකු වූ ලැස්වෙල් එහි සීමා ඉක්මවා සන්නිවේදන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂ උනන්දුවක් දැක්වීය. ඔහු ඉදිරිපත් කළ අදහස් සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ න්‍යායික සංවර්ධනයට ප්‍රබල ලෙස බලපෑවේ ය. ලැස්වෙල් 1948 දී ඉදිරිපත් කළ සන්නිවේදන ආකෘතිය සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ වඩාත් ප්‍රචලිත වූවකි . (https://en.m.wikipedia.org/wiki/Harold_Lasswell)

(https://www.britannica.com/biography/Harold-Lasswell)

## හැරල්ඩ් ඩී. ලැස්වෙල්

ක්ලෝඩ් ෂැනොන්

## ක්ලෝඩ් ෂැනොන්



ක්ලෝඩ් ෂැනොන් ඉලෙක්ට්‍රොනික ඉංජිනේරුවරයෙකු මෙන් ම ගණිතඥයෙකි. 1916 දී ඇමෙරිකාවේ උපත ලද ඔහු ගණිතය, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව මෙන් ම සන්නිවේදන විෂය ක්ෂේත්‍රය කෙරෙහි ද විශේෂ උනන්දුවකින් කටයුතු කළේ ය. මිචිගන් විශ්වවිද්‍යාලයෙන් ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු සහ ගණිත ශාස්ත්‍රයට ආචාර උපාධි දෙකක් හිමි කරගත් ඔහු තොරතුරු න්‍යායේ පියා ලෙස ද සලකනු ලැබේ. 1949 දී ඉංජිනේරු විද්‍යාවේ න්‍යාය ආශ්‍රයෙන් වොරන් වීවර් සමග එක්ව ගොඩ නැගූ සන්නිවේදන ආකෘතිය හේතුවෙන් ක්ලෝඩ් ෂැනොන් සන්නිවේදන විෂය ක්ෂේත්‍රය තුළ ද ප්‍රසිද්ධියට පත් විය. (https://www.britannica.com/biography/Claude-Shannon)

(https://en.m.wikipedia.org/wiki/Claude_Shannon)

## වොරන් වීවර්



වොරන් වීවර් අමෙරිකාවේ විද්‍යාඥයකු මෙන්ම ගණිතඥයෙකි. 1894 දී උපත ලැබූ වොරන් වීවර් ඉංජිනේරු සහ ගණිත ශාස්ත්‍රය සම්බන්ධයෙන් මූලික උපාධි හිමි කර ගත්තේ ය. පසුව කැලිෆෝනියා තාක්ෂණික ආයතනයේ ගණිතය පිළිබඳ මහාචාර්යවරයා ලෙස කටයුතු කර තිබේ. අමෙරිකා එක්සත් ජනපදයේ විද්‍යා තාක්ෂණය දියුණු කිරීමේ දී වොරන් වීවර්ගේ ලැබී ඇති දායකත්වය වඩාත් ඇගයීමට ලක් වූවකි. වොරන් වීවර් ජනතාවගේ විද්‍යාත්මක දැනුම දියුණු කිරීම සඳහා ඇඩි උනන්දුවෙන් ක්‍රියා කළ අයෙකි. ඔහු සන්නිවේදන විශේෂයේ වඩාත් ජනප්‍රිය වන්නේ 1949 දී ක්ලෝඩ් ෂැනොන් සමග එක්වී දුරකථන සන්නිවේදන තාක්ෂණ ක්‍රියාවලිය විමසුමට ලක් කරමින් ගොඩනැගූ සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ ගණිතමය ආකෘතියක් නිර්මාණය කිරීම හේතුවෙනි. සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ වූ විග්‍රහයන් පුළුල් වීමට එය බලපෑවේ ය. (https://rockfound.rockarch.org/biographical/-/asset_publisher/6ygcKECNI1nb/content/warren-weaver)

(https://en.m.wikipedia.org/wiki/Warren_Weaver)

1940 දශකයේ දී මහාචාර්ය විල්බර් ශ්‍රාම් විසින් සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ආයතන ගත කිරීමට පියවර ගන්නා ලදී. ඒ අතර,

- ජනමාධ්‍ය පාසල්,සන්නිවේදන පර්යේෂණ ආයතන ස්ථාපිත කිරීම
- විශ්වවිද්‍යාල සඳහා නව අධ්‍යයන අංශ ආරම්භ කිරීම පෙන්වා දිය හැකිය.

සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ඉගැන්වීම ආරම්භ කළ පළමු විශ්වවිද්‍යාලය වන්නේ ඇමෙරිකාවේ ***ඉලිනොයිස් විශ්වවිද්‍යාලය*** යි.



**ඉලිනොයිස් විශ්වවිද්‍යාලය**

60 දශකයේ මුල්භාගයේ දී සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව සහ ඉංග්‍රීසි භාෂාව ආදී විෂය ක්ෂේත්‍ර තුළ අන්තර්ගත ව තිබූ සන්නිවේදන අධ්‍යයනය ස්වාධීන විෂය ක්ෂේත්‍රයක් ලෙස අධ්‍යයනය කිරීම ආරම්භ විය.

60 , 70 දශකවල සන්නිවේදන ක්ෂේත්‍රයේ විද්වතුන් විසින් සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයන මගින්

ජනමාධ්‍යවලින් ඉදිරිපත් වූ සන්දේශ සහ මාධ්‍යයන්ගේ ක්‍රියාකාරීත්වය ජන ජීවිතයේ සියලු දේ කෙරෙහි බලපෑම් ඇති කිරීමට හේතු වන බව අනාවරණය විය.

මහාචාර්ය විල්බර් ශ්‍රාම් විසින් රූපවාහිනී මාධ්‍ය පිළිබඳ සිදු කරන ලද ප්‍රථම පර්යේෂණ වාර්තාව මගින් ඔහු ප්‍රකාශ කර සිටියේ,

*ළමයින්ගේ සමාජ සම්බන්ධතා දුරස් වීම හා රූපවාහිනී භාවිතය අතර සම්බන්ධතාවක් පවතින බවයි.

*දෙමව්පියන් සමග අඬදබර කර ගන්නා දරුවන් තම නොරිස්සුම් සහගත හැඟීම්වලින් පලා යාමට සහ සිත් වේදනාවන් අමතක කර ගැනීමට රූපවාහිනිය නැරඹීමට යොමු වන බව තවදුරටත් එම වාර්තාවෙන් කරුණු ඉදිරිපත් කළේය.

පෙන්සිල්වේනියානු විශ්ව විශ්වවිද්‍යාලයේ පර්යේෂණ කණ්ඩායම විසින් ප්‍රචණ්ඩ ක්‍රියා සහිත සහ රහිත රූපවාහිනී කාටූන් වැඩසටහන් ළමයින් කණ්ඩායම් දෙකකට නැරඹීමට අවස්ථාව ලබා දී සිදු කළ

පර්යේෂණය, මහාචාර්ය විල්බර් ශ්‍රාම් සිය පර්යේෂණ අධ්‍යයනය මඟින් ඉදිරිපත් කළ කරුණු තහවුරු කිරීමට සමත් වී ඇත.

**පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාල පර්යේෂණ කණ්ඩායම විසින් රූපවාහිනියේ ප්‍රචණ්ඩ ක්‍රියා සහිත වැඩසටහන් නැරඹීම නිසා ළමයින් තුළ ප්‍රධාන වශයෙන් ඇති විය හැකි වෙනස්කම් තුනක් සිදුවන බව පෙන්වා දෙන ලදී.**

1.වේදනාත්මක දේ පිළිබඳ දරුවන්ගේ සංවේදීතාව අඩු වීම

2. දරුවන් ඔවුන් ජීවත්වන පරිසරය හා අවට ලෝකය පිළිබඳ බියක් ඇති කර ගැනීම

3. අන් අය සමඟ කටයුතු කිරීමේ දී ආක්‍රමණශීලී වන්නටත් ඉක්මනින් ආරවුල් ඇති කර ගන්නටත් දරුවන් තුළ නැඹුරුව වැඩි වීම



## පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාලය

මෙම පර්යේෂණ සහ අධ්‍යයන නිසා සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය තවදුරටත් සංවර්ධනය විය. 80 සහ 90 දශකවල අංකිත තාක්ෂණික මාධ්‍ය මෙවලම් භාවිතයට පැමිණීම සහ වර්තමානය වනවිට නව මාධ්‍ය, සමාජ මාධ්‍යවල ක්‍රියාකාරිත්වය නිසා සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයේ විෂය පථය තවදුරටත් පුළුල් කිරීමට හේතු විය.

සන්නිවේදනය විෂය සජීව මෙන් ම සක්‍රීය විෂයකි. සන්නිවේදන තාක්ෂණයේ දියුණුව සමඟ අතීතයේ පටන් සන්නිවේදන ක්ෂේත්‍රය වර්ධනය වූ බව පැහැදිලි කරුණකි. එසේම වර්තමානයේ සහ අනාගතයේ ද සන්නිවේදන තාක්ෂණයේ ඇති වන දියුණුව, නවීන සන්නිවේදන මෙවලම්,ඒවායේ භාවිතය, ඒවා මගින් සමාජය වෙත ඇති කරනු ලබන බලපෑම අනුව ඉදිරි කාලයේදී ද සන්නිවේදන විෂය  වෙනස්වීම්වලට ලක්වනු ඇත.



## සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ ශාස්ත්‍රීය වශයෙන් අධ්‍යයනය කිරීමෙහි වැදගත්කම

- ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සන්නිවේදන ක්‍රියාදාමය හා මාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධය
- විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය
- අවශ්‍ය, අදාළ තොරතුරු තෝරා ගැනීමේ හැකියාව
- ගවේෂණශීලී භාවය හා විචාරශීලි චින්තනය දියුණු වීම
- මාධ්‍ය සාක්ෂරතාව
- යහපත්, ආචාරශීලී හා ඵලදායි මානව අන්තර් සම්බන්ධතා
- සමාජ ප්‍රගමනය සඳහා සක්‍රීය දායකත්වය
- නිර්මාණාත්මක චින්තනය හා මාධ්‍ය සන්දේශ නිර්මාණය
- සංවර්ධනාත්මක හා ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයෙන් පෝෂණය වූ පුරවැසියෙකු වීමට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා හා පුරුදු
- ජන මාධ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය පුද්ගලයා තුළ ගොඩනැංවේ.

**නිපුණතා මට්ටම - 1.2 ශ්‍රී ලංකාවට සන්නිවේදනය විෂයය හඳුන්වා දීම හා එයට පසුබිම් වූ සාධක පිළිබඳ අවබෝධය ලබයි.**

## ශ්‍රී ලංකාවට සන්නිවේදන අධ්‍යයනය විෂයය හඳුන්වා දීම

සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට ඇතුළත් වන පාඨමාලාවක් විධිමත් ආකාරයෙන් ප්‍රථම වරට හඳුන්වා දීම සිදු වන්නේ දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලය (Junior Campus) මූලික වීමෙනි. වර්ෂ 1968, 1969 කාලයේ දී "පුවත්පත් කලාවේදය (Journalism)" නමින් එහි පාඨමාලාවක් හඳුන්වා දෙන ලදි.

වසර දෙකක කාලයක් ක්‍රියාත්මක කෙරුණු මෙම පාඨමාලාව සඳහා විෂය නිර්දේශය සකස් කරනු ලැබ ඇත්තේ ආචාර්ය එඩ්වින් ආරියදාස මහතා විසිනි .

1971 කැරැල්ලෙන් පසු මෙරට විශ්ව විද්‍යාල සඳහා වෘත්තීය අභිමුඛ පාඨමාලා හඳුන්වා දීමේ දී සන්නිවේදන විෂය ශ්‍රී ලංකාවේ විශ්ව විශ්වවිද්‍යාල පද්ධතියට හඳුන්වා දී ඇත.

1973 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රථම වරට ජන සන්නිවේදන අධ්‍යයන අංශයක් ආරම්භ කරන ලදී. මේ සඳහා මූලිකත්වය ගැනීම පිණිස විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් විද්වත් කමිටුවක් පිහිට වූ අතර එහි,

- ✓ **මහාචාර්ය විමල් දිසානායක**
- ✓ **මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර**
- ✓ **මහාචාර්ය එම්. බී. ආරියපාල**
- ✓ **මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර**
- ✓ **මහාචාර්ය කෛලාසපති**
- ✓ **ආචාර්ය එඩ්වින් ආරියදාස**
- ✓ **ඩී. සී. රණතුංග** යන විද්වතුන් ප්‍රමුඛත්වය ගන්නා ලදී .
- ✓

මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර සහ මහාචාර්ය විමල් දිසානායක විෂය ඉගැන්වූ ප්‍රථම කථිකාචාර්යවරු වූ අතර බාහිර කථිකාචාර්යවරු ලෙස ආචාර්ය එඩ්වින් ආරියදාස, ආචාර්ය පියසෝම මෙදිස්, ඩී. බී. නිහාල්සිංහ, කේ. ජයතිලක, මහගම සේකර, ඩබ්ලිව්. ඩී. අමරදේව, ඩී. සී. රණතුංග සහ පියසිරි ගුණරත්න යන විද්වත්හු කටයුතු කළහ .



**කැළණිය විශ්වවිද්‍යාලය**





**මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර මහතා** **මහාචාර්ය විමල් දිසානායක මහතා**

1972 වසරේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ද "පුවත්පත් කලාව" යනුවෙන් ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කර ඇති අතර වසරකින් පමණ පසු එම පාඨමාලාව නවතා දමා ඇත.

60 දශකයේ දී ලංකා ගුවන්විදුලි සේවය හා ලේක්හවුස් ආයතනය මගින් මාධ්‍යවේදීන් සඳහා පුහුණු පාඨමාලා පවත්වා ඇත.

වර්තමානය වන විට සන්නිවේදන විෂයය පිළිබඳ පාඨමාලා කැලණිය විශ්වවිද්යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී පාලි මණ්ඩපය, රජරට විශ්වවිද්‍යාලය, විවෘත විශ්වවිද්‍යාලය, නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපය සහ යාපනය විශ්වවිද්‍යාලය වැනි විශ්වවිද්‍යාල විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

එසේම ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2006 වර්ෂයේ දී ප්‍රථම වරට 10 ශ්‍රේණියටත්, 2007 වර්ෂයේ දී 11 ශ්‍රේණියටත් අතිරේක විෂයක් ලෙස සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හඳුන්වා දී ඇති

අතර 2008 වර්ෂයේ සිට උසස් පෙළ කලා විෂය ධාරාවට ද සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය විෂය ඇතුළත් කර තිබේ.

**නිපුණතා මට්ටම - 1.3 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ඉගෙනීමෙහි අවශ්‍යතාව පැහැදිලි කරයි.**

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ඉගෙනීමෙහි අවශ්‍යතාව

මාධ්‍ය අධ්‍යාපනය යනු ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ අවධානය යොමු කරන පුළුල් විෂය ක්ෂේත්‍රයකි. මාධ්‍ය අධ්‍යාපනය යනු පුද්ගලයා මාධ්‍ය සාක්ෂරතාවෙන් යුක්ත අයකු බවට පත්කරලීමේ ක්‍රියාවලියයි. මෙහි දී සමස්තයක් ලෙස සියලු ම මාධ්‍ය කෙරෙහි අවධානය යොමු කිරීම ද දැකිය හැකි ය. "සියලු ම මාධ්‍ය" යන්නට චලන රූප ඇතුළත් චිත්‍රපට, රූපවාහිනිය , වීඩියෝ පට ආදියත් හඬ මාධ්‍ය යටතට ගැනෙන ගුවන් විදුලිය, පටිගත කරන ලද සංගීත ඇතුළත් සියලු මාධ්‍යයත්, මුද්‍රිත මාධ්‍යට අයත් පුවත්පත් , සඟරා, පෝස්ටර් ආදියත් නව අංකිත තාක්ෂණය හෙවත් ඩිජිටල් මාධ්‍ය භාවිතයට ගන්නා සියලුම මාධ්‍යයත් ඇතුළත් වේ.

යුනෙස්කෝ සංවිධානය මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බවට නිර්දේශ කරමින් තවදුරටත් මෙසේ සඳහන් කර ඇත.

**"එයින් සමාජයට මුද්‍රිත මාධ්‍ය හා විද්‍යුත් මාධ්‍ය විචාරශීලීව පරිහරණය කිරීමට අවශ්‍ය දැනුම, කුසලතා, ආකල්ප පෝෂණය කළ හැකි බවත් එය ජීවත් වීම සඳහා අත්‍යවශ්‍ය නිපුණතාවක් වන බවත් මාධ්‍ය අධ්‍යාපනය ලබා දීම සඳහා සකස් කරනු ලබන වැඩසටහන්වල මාධ්‍ය නිෂ්පාදනයන් සම්බන්ධ විවරණයන්, නිර්මාණශීලී ආවේදනයන් පළ කිරීමේ මාධ්‍යයක් ලෙස ජනමාධ්‍ය භාවිත කළ හැකි ආකාරයන්, ඵලදායී ලෙස මාධ්‍ය පරිහරණය කිරීම හා සක්‍රීය අයුරින් මාධ්‍ය වැඩසටහන්වලට සහභාගී වීම යන කරුණු පිළිබඳ ව අන්තර්ගත කළ යුතු බවත් ය."**

පෙර පාසල් අවධියේ සිට විශ්වවිද්‍යාල මට්ටම දක්වා වැඩිහිටි අධ්‍යාපනයේ ද පුළුල් මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කරමින් ඒවාට සහාය දෙන ලෙස 1982 දී යුනෙස්කෝ සංවිධානය ගෲන්වල්ට් ප්‍රකාශනයෙන් කළ නිර්දේශ පදනම් කරගෙන මාධ්‍ය අධ්‍යාපන විෂය සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී. ඒ ජන මාධ්‍යයන්ගේ ක්‍රියාකාරීත්වය ළමා හා තරුණ පරපුර කෙරෙහි ඇති කරන අහිතකර බලපෑමේ ප්‍රබල බව හේතුවෙනි. මාධ්‍ය අධ්‍යාපනය යන පුළුල් විෂය ක්ෂේත්‍රය මගින් විචාරශීලීව මාධ්‍ය

පරිහරණය කිරීමට අවශ්‍ය ශික්ෂණයත් එයින් මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කර ගැනීමටත් පුද්ගලයාට මග පෙන්වනු ලබයි .

**අ.පො.ස. උසස් පෙළ විභාගයට අයත් මෙම සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය කොටස් දෙකකින් සමන්විත වේ.**

1. සන්නිවේදනය
2. මාධ්‍ය අධ්‍යයනය

## සන්නිවේදනය යන විෂය කොටසට ගැනෙන කරුණු

- **සන්නිවේදනය පිළිබඳ නිර්වචන**
- **සන්නිවේදනයේ පදනම**
- **සන්නිවේදනයේ කාර්යභාරය**
- **විවිධ සන්නිවේදන වර්ග**
- **සන්නිවේදන ආකෘති**
- **සන්නිවේදනය පිළිබඳ න්‍යායාත්මක කරුණු**
- **සන්නිවේදනය ප්‍රායෝගික ව භාවිත කිරීමේ කුසලතා**

## මාධ්‍ය අධ්‍යයනය විෂය කොටසට ගැනෙන කරුණු

- **මාධ්‍ය පිළිබඳ ඉගෙනීම, හැදෑරීම**
- **මාධ්‍යයේ ස්වභාවය**
- **මාධ්‍ය අන්තර්ගතය**
- **මාධ්‍යයේ ඓතිහාසික පරිණාමය**
- **මාධ්‍ය ක්‍රියාකාරිත්වය හඳුනා ගැනීම**
- **මාධ්‍ය පුද්ගලයාට, සමාජයට හා සංස්කෘතියට බලපාන ආකාරය පිළිබඳ හැදෑරීම**

සන්නිවේදනය යන්න මානව අන්තර් සම්බන්ධතා පැවැත්වීමේ දී අත්‍යවශ්‍ය ම සහ ප්‍රමුඛතම මෙවලමක් ලෙස හඳුනාගත හැකි ය. එබැවින් සන්නිවේදන කුසලතාව සෑම අයෙකුම සතු විය යුතු සහ ප්‍රගුණ කළ යුතු හැකියාවක් වන බව අවධානයට ගත යුතුයි.

මාධ්‍ය අධ්‍යාපනය මගින් විචාරශීලීත්වයෙන් යුතුව මාධ්‍ය පරිහරණය කිරීමට අවශ්‍ය අවබෝධය සහ ශික්ෂණය ලබා දෙන අතර එයින් මාධ්‍ය සාක්ෂරතාව ද වර්ධනය වේ.

යහපත් සන්නිවේදකයකු මෙන් ම යහපත් පුරවැසියකු වීමට අවශ්‍ය සන්නිවේදන ඥානයත්, විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමේ ශික්ෂණයත් ඇති කිරීමේ අරමුණෙන් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය විෂය නිර්දේශය සකසා ඇත.

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරීමේ අවශ්‍යතාව

- **සන්නිවේදන කුසලතා වර්ධනය**
- **මාධ්‍ය සාක්ෂරතාව**
- **නිර්මාණශීලී සන්නිවේදන කුසලතා වර්ධනය**
- **විචාරශීලී මාධ්‍ය පරිහරණය**
- **අවස්ථෝචිත  භාෂා භාවිතය**
- **මාධ්‍ය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධය**
- **මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම**
- **තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය**
- **මාධ්‍ය ආචාර ධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධය**
- **යහපත් පුරවැසියකු ලෙස සංවර්ධනයට දායක වීම**

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

# 1 පාඩම

# 1පත්‍රය

1. මුල්කාලීන ප්‍රාථමික සමාජවල ජීවත් වූ මිනිසා අදහස් හුවමාරු කර ගත්තේ,

(1) කථන භාෂාව භාවිතයෙනි.

(2) භාෂාව හා ලිපි ලේඛන භාවිතයෙනි.

(3) සංඥා ශබ්ද සංකේත භාවිතයෙනි.

(4) අණබෙරය සහ ගින්දර භාවිතයෙනි.

(5) පුවත්පත් සහ ගුවන් විදුලිය භාවිතයෙනි.

2. පෙර පාසල් අවධියේ සිට මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බවට නිර්දේශ කර ඇත්තේ,

(1) ඉලිනොයිස් විශ්වවිද්‍යාලය යි.

(2) යුනෙස්කෝ සංවිධානය යි.

(3) මානව හිමිකම් සංවිධානය යි.

(4) දෙහිවල කනිෂ්ඨ විද්‍යාලය යි.

(5) ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය යි.

3. සන්නිවේදන විෂයය ස්වාධීන විෂයය ක්ෂේත්‍රයක් ලෙස බිහිවීමට ප්‍රථම වෙනත් විෂයය ක්ෂේත්‍රයන් යටතේ අන්තර්ගත වී තිබිණි. එම විෂයය ක්ෂේත්‍ර වන්නේ,

(1) මනෝ විද්‍යාව, දේශපාලන විද්‍යාව හා ආර්ථික විද්‍යාව ය.

(2) දේශපාලන, විද්‍යාව මනෝ විද්‍යාව හා සමාජ විද්‍යාව ය

(3) දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව හා මනෝ විද්‍යාව ය.

(4) දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව හා ආර්ථික විද්‍යාව ය.

(5) මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව හා ආර්ථික විද්‍යාව ය.

4." පුවත්පත් කලාව " යනුවෙන් පාඨමාලාවක් ආරම්භ කර ඇත්තේ,

(1) දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලයේ ය.

(2) ලේක්හවුස් ආයතනයේ ය.

(3) කැලණිය විශ්වවිද්‍යාලයේ ය.

(4) කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ය.

(5) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ය.

5. උසස් පෙළ කලා විෂයය ධාරාවට "සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය" විෂයය ඇතුළත් වන්නේ,

(1) 2006 වර්ෂයේ දී ය.

(2) 2007 වර්ෂයේ දී ය.

(3) 2008 වර්ෂයේ දී ය.

(4) 2011 වර්ෂයේදී ය.

(5) 2012 වර්ෂයේ දී ය.

6. යුනෙස්කෝ සංවිධානය ශෲන්වල්ට් ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ,

(1) 1985 වර්ෂයේ දී ය.

(2) 1990 වර්ෂයේ දී ය.

(3) 1982 වර්ෂයේ දී ය.

(4) 1978 වර්ෂයේ දී ය.

(5) 1983 වර්ෂයේ දී ය.

7. ජනමාධ්‍ය පාසල්, සන්නිවේදන පර්යේෂණ ආයතන වැනි සන්නිවේදන ආයතන ආරම්භ කිරීම සඳහා පුරෝගාමී වූයේ,

(1) හැරල්ඩ් ඩී ලැස්වෙල් ය.

(2) ජෝර්ජ් ගාබ්නර් ය.

(3) විල්බර් ශ්‍රාම් ය.

(4) ක්ලෝඩ් ෂැනොන් ය.

(5) චාල්ස් හෝර්ටන් කූලි ය.

8. ප්‍රාථමික සමාජයේ සිට සන්නිවේදන විකාශයේ ආරම්භය හා වර්තමානය සනිටුහන් කරන්නේ,

(1) ශබ්ද, සංඥා, සංකේත සහ අංකිත තාක්ෂණික මාධ්‍ය මෙවලම් ය.

(2) භාෂාව, අක්ෂර මාලාව සහ නූතන මාධ්‍ය විසින් ය.

(3) අවාචික, දෘශ්‍ය මාධ්‍ය සහ රූපවාහිනී මාධ්‍ය විසින් ය .

(4) ගින්දර, අණබෙර, ලේඛනය සහ නව මාධ්‍ය මෙවලම් විසින් ය.

(5) කථනය, ශ්‍රවණය, දෘශ්‍ය මාධ්‍ය සහ විද්‍යුත් නූතන මාධ්‍ය මගින් ය.

9. පුද්ගලයාගේ සමාජ ජීවිතයේ වැදගත් ම හා කේන්ද්‍රීය සාධකය සන්නිවේදනය ලෙස හඳුන්වා දුන්නේ,

(1) චාල්ස් කූලි, හැරල්ඩ් ඩී ලැස්වෙල්, ක්ලෝඩ් ෂැනොන් ය.

(2) විල්බර් ශ්‍රාම්,වෝල්ටර් ලිප්මාන්, කර්ට් ලෙවින් ය.

(3) වොරන් වීවර්, විල්බර් ශ්‍රාම්,  හැරල්ඩ් ඩී ලැස්වෙල් ය.

(4) ජෝර්ජ් ගාබ්නර්, පෝල් ලැසාස්ෆෙල්ඩ්, කාර්ල් හවුලන්ඩ් ය.

(5) චාල්ස් කූලී, වෝල්ටර් ලිප්මාන්, ජෝන් ඩූවී ය.

10. සන්නිවේදන අධ්‍යයනයෙහි ප්‍රධාන අරමුණ තේරුම් ගැනීමට අවශ්‍ය වන සාධක වන්නේ,

A - මිනිසා නිරන්තරයෙන් ලබන අත්දැකීම්.

B - මිනිසා  එකතු කර ගන්නා තොරතුරු ක්‍රියාවට නංවන ආකාරය.

C - මිනිසා හුවමාරු කර ගන්නා තොරතුරුවල කේන්ද්‍රීය සාධකය සන්නිවේදනය වීම.

D - සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ව හැදෑරීම.

E - ජන සන්නිවේදන මාධ්‍යවලට විවිධ සීමාවන් පැනවීම.

(1) A, B, D

(2) D, C, D

(3) A, C , D, E

(4) A, B, C, D

(5) A, B, C, D, E

11. වර්තමානයේ අති විශාල ලෙස ප්‍රමාණාත්මක ව පැතිරී යන මාධ්‍ය තාක්ෂණික තොරතුරු ගලනය තුළින් සිදු වන අයහපත් බලපෑමෙන් මිනිසා ගලවා ගැනීමට සිදු කළ යුත්තේ,

(1) මාධ්‍ය භාවිතයෙන් පුද්ගලයා ක්‍රමයෙන් ඉවත් කිරීමට කටයුතු යෙදීමයි.

(2) නව මාධ්‍ය, සමාජ මාධ්‍ය සීමා කිරීමට නීති සකස් කිරීමයි.

(3) මාධ්‍ය පරිහරණයට අවශ්‍ය නිසි දැනුමෙන් පුද්ගලයා සන්නද්ධ කිරීමයි.

(4) මාධ්‍ය ආකෘති සැකසීම පිළිබඳ ව ලෝක මතයක් ඇති කිරීමයි.

(5) විද්‍යුත් මාධ්‍යයේ ගුණාත්මක භාවය පිරික්සීමේ නියාමනයක් ඇති කිරීමයි.

12. මානව සමාජය තුළ සන්නිවේදනය මගින් සිදු කරනු ලබන ප්‍රබල සමාජ මෙහෙවර වන්නේ,

(1) අන්තර් සම්බන්ධතා ගොඩ නැඟීමයි.

(2) ශික්ෂණය ඇති කිරීමයි.

(3) අදහස් පොදු බවට පත් කිරීමයි.

(4) විනෝදාස්වාදය ලබා දීමයි.

(5) ග්‍රාහක ග්‍රහ බලපෑම් ඇති කිරීමයි.

13. 1982 දී යුනෙස්කෝ සංවිධානය ග්‍රෲන්වල්ට් ප්‍රකාශය මගින් මාධ්‍ය අධ්‍යයනය සඳහා නිර්දේශ කරන ලද්දේ,

(1) බිඳ වැටුණු මානසික තත්ත්වයන් ඉලක්ක කර ගනිමින් මාධ්‍ය ඔස්සේ සරල විනෝදය සම්පාදනයටයි.

(2) ජන මාධ්‍ය ආයතන ක්‍රියාකාරිත්වය පිළිබඳ ව පුද්ගලයකු තුළ අවබෝධය ගොඩ නැංවීමයි.

(3) සන්නිවේදන තාක්ෂණයේ දියුණුව සමාජය වෙත එල්ල කරන බලපෑමේ ස්වභාවය පිළිබඳ ව දැනුවත් කිරීමයි.

(4) මාධ්‍ය සාක්ෂරතාව, විචාරශීලී ලෙස මාධ්‍ය පරිහරණය හා නිර්මාණශීලී චින්තනය දරුවන් තුළ ඇති කිරීමයි.

(5) සංවර්ධනාත්මක හා ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයෙන් පෝෂණය වූ පුරවැසියෙකු නිර්මාණය කිරීමයි.

14. සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක් ලෙස අධ්‍යනය කිරීම කෙරෙහි ලෝකයේ අවධානය යොමු වන්නේ,

(1) 20 වන සියවසේ අග භාගයේ දී ය.

(2) 20 සියවසේ මුල් භාගයේ දී ය.

(3) 19 වන සියවසේ අග භාගයේ දී ය.

(4) 21 වන සියවසේ මුල් භාගයේ දී ය.

(5) 21 වන සියවසේ අග භාගයේ දී ය.

15. ජනමාධ්‍ය බිහි වීම, වර්ධනය හා ව්‍යාප්තිය කෙරෙහි බලපෑ වේ,

(1) සන්නිවේදන විශේෂයෙන් ශාස්ත්‍රීය විෂයයක් වශයෙන් වර්ධනය වීම ය.

(2) විවිධ විද්වතුන්ගේ අදහස් හා පර්යේෂණ අධ්‍යයනයන් ය.

(3) කාර්මික විප්ලවය, පළමුවන හා දෙවන ලෝක යුද්ධ හේතුවෙන් සන්නිවේදන තාක්ෂණය දියුණු වීම ය.

(4) ග්‍රෲන්වල්ට් ප්‍රකාශනය මගින් අවධාරණය කරන ලද කරුණු ය.

(5) පළමුවන හා දෙවන ලෝක යුද්ධ ය.

16. පහත ලබා දී ඇති තොරතුරු අනුව නිවැරදි සම්බන්ධතාව පෙන්නුම් කරන වරණය තෝරන්න.

| | |
|---|---|
| A: ජෝන් ඩුවී | 1: සමාජ සංවිධානය |
| B: වෝල්ටර් ලිප්මාන් | 2: ජනතාව හා ඔවුන්ගේ ගැටලු |
| C: චාල්ස් හෝර්ටන් කූලි | 3: ජනමතය |

(1) A2, B1, C3

(2) A1, B3, C2

(3) A3, B2, C1

(4) A3, B1, C2

(5) A2, B3, C1

17. 1940 දශකයේ දී ජනමාධ්‍ය පාසල්, සන්නිවේදන පර්යේෂණ ආයතන ස්ථාපිත කිරීම හා විශ්වවිද්‍යාලය සඳහා නව අධ්‍යයන අංශ ආරම්භ කිරීම සඳහා පියවර ගන්නා ලද්දේ,

(1) ක්ලෝඩ් ෂැනොන් ය.

(2) වොරන් වීවර් ය.

(3) ජෝර්ජ් ගාබ්නර් ය.

(4) විල්බර් ශ්‍රාම් ය.

(5) හැරල් ඩී ලැස්වෙල් ය.

18. සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ඉගැන්වීම කළ පළමු විශ්වවිද්‍යාලය වන්නේ,

(1) පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාලය යි.

(2) ඉලිනොයිස් විශ්වවිද්‍යාලය යි.

(3) හාවර්ඩ් විශ්වවිද්‍යාලය යි.

(4) කොලොම්බියා විශ්වවිද්‍යාලය යි.

(5) මිචිගන් විශ්වවිද්‍යාලය යි.

19. "දැන් හැදෙන දරුවන් කිසිම දෙයකට අවධානය යොමු කරන්නේ නැහැ. රූපවාහිනිය දිහා ඔහේ බලාගෙන ඉන්නවා" මෙවැනි චෝදනා පිළිබඳ පර්යේෂණාත්මක පිළිතුරක් සපයන ලද්දේ,

(1) කර්ට් ලෙවින් ය.

(2) විල්බර් ශ්‍රාම් ය.

(3) පෝල් ලැසාස්ෆෙල්ඩ් ය.

(4) වෝල්ටර් ලිප්මාන් ය.

(5) ජෝර්ජ් ගබ්නර් ය.

20. සන්නිවේදන විෂයය ක්ෂේත්‍රයට ඇතුළත් වන පාඨමාලාවක් විධිමත් ආකාරයෙන් ප්‍රථම වරට හඳුන්වා දීම සිදු වන්නේ,

(1) කැලණිය විශ්වවිද්‍යාලයේ ය.

(2) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ය.

(3) දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලයේ ය.

(4) කොළඹ විශ්වවිද්‍යාලයේ ය.

(5) විවෘත විශ්වවිද්‍යාලයේ ය.

21. කැලණිය විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයන අංශයේ විෂය ඉගැන්වූ ප්‍රථම කථිකාචාර්යවරු වන්නේ,

(1) මහාචාර්ය විමල් දිසානායක සහ ආචාර්ය එඩ්වින් ආරියදාස ය.

(2) මහාචාර්ය විමල් දිසානායක සහ මහගම සේකර ය.

(3) මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර සහ ආචාර්ය එඩ්වින් ආරියදාස ය.

(4) මහාචාර්ය විමල් දිසානායක සහ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර ය.

(5) මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර සහ ආචාර්ය පියසෝම මෛදිස් ය.

22. ජාතික අධ්‍යාපන ආයතනය විසින් පාසල් අධ්‍යාපනයට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයක් ලෙස හඳුන්වා දෙන ලද්දේ,

(1) 2006 වර්ෂයේ දී ය.

(2) 2007 වර්ෂයේ දී ය.

(3) 2011 වර්ෂයේ දී ය.

(4) 2008 වර්ෂයේ දී ය.

(5) 2009 වර්ෂයේ දී ය.

23. " මාධ්‍ය අධ්‍යයනය" යනු,

(1) සන්නිවේදන නිර්වචන, පදනම, ආකෘති ආදිය පිළිබඳ හැදෑරීමයි.

(2) නව මාධ්‍ය, නූතන මාධ්‍ය, ජනමාධ්‍ය ආදිය පිළිබඳ ව න්‍යායාත්මක ව හැදෑරීමයි.

(3) අන්තර්ජාලය හා බැඳුණු මාධ්‍ය ක්‍රියාවලිය පිළිබඳ හැදෑරීමයි.

(4) මාධ්‍ය සාක්ෂරතාව සමාජයට ලබා දීමයි.

(5) මාධ්‍ය පිළිබඳ ඉගෙනීම, හැදෑරීම, මාධ්‍යයේ ස්වභාවය, අන්තර්ගතය, පරිණාමය හා ක්‍රියාකාරීත්වය ආදිය පිළිබඳ හැදෑරීමයි.

24. "සන්නිවේදනය" යන්නට **නොගැළපෙන** වාක්‍ය තෝරන්න.

(1) මිනිසා සමාජ කණ්ඩායම් සමග සබඳතා දක්වන ආකාරයයි.

(2) තොරතුරු හුවමාරුව සන්නිවේදනයයි.

(3) පුද්ගලයා හා සමාජ සම්බන්ධතාවන්ගේ පදනම සන්නිවේදනයයි.

(4) සන්නිවේදනය ආරම්භ වන්නේ භාෂාව සකස් කර ගැනීමත් සමගයි.

(5) සන්නිවේදනය තුළින් ගැටලු නිර්මාණය වීමත් විසඳා ගැනීමත් සිදු වේ.

25. 1968, 1969 " පුවත්පත් කලාවේදය" පාඨමාලාව හඳුන්වා දෙන කාලයේ අධ්‍යාපන ඇමති ධුරය දැරුවේ,

(1) රිචඩ් පතිරණ මහතා ය.

(2) අනුර බණ්ඩාරනායක මහතා ය.

(3) සී ඩබ්ලිව් ඩබ්ලිව් කන්නන්ගර මහතා ය.

(4) ලයනල් ජයතිලක මහතා ය.

(5) අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතා ය.

26. "පුවත්පත් කලාවේදය" පාඨමාලාවේ විෂය නිර්දේශය සකස් කරනු ලැබුයේ,

(1) මහාචාර්ය විමල් දිසානායක විසිනි.

(2) මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර විසිනි.

(3) ආචාර්ය එඩ්වින් ආරියදාස විසිනි.

(4) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර විසිනි.

(5)ආචාර්ය  පියසෝම මේදිස් විසිනි.

27. ශ්‍රී ලංකාවට සන්නිවේදන විෂයය හඳුන්වා දීම සම්බන්ධ **නොගැළපෙන** භාග්‍යය භාග්‍යයක් වන්නේ,

(1) "පුවත්පත් කලාවේදය" පාඨමාලාව සඳහා විෂය නිර්දේශය සකස් කිරීම.

(2) ප්‍රථම වරට විධිමත් ලෙස සන්නිවේදන ක්ෂේත්‍රයේ පාඨමාලාවක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මූලික වී සකස් කිරීම.

(3) 1971 කැරැල්ලෙන් පසු සන්නිවේදන විෂයය වෘත්තීය අභිමුඛ පාඨමාලාවක් ලෙස හඳුන්වා දීම.

(4) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් සිංහල දෙමළ මහාචාර්යවරුන්ගෙන් සමන්විත විද්වත් කමිටුවක් පත් කිරීම.

(5) 1963 දී කැලණිය විශ්ව විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයන අංශය ආරම්භ කිරීම.

28. යුනෙස්කෝ ගෲන්වල්ට් ප්‍රකාශනයේ අන්තර්ගත වන මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් සම්බන්ධ නිර්දේශයන් තෝරන්න.

A - පෙර පාසල් අධ්‍යාපනය තුළ ද මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කළ යුතු බව.

B - පෙර පාසල් අධ්‍යාපනය තුළත් විශ්වවිද්‍යාල මට්ටම දක්වාත් මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව.

C - වැඩිහිටි අධ්‍යාපනය තුළ ද මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට සහාය දිය යුතු බව.

D - මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම රාජ්‍ය අංශය විසින් පමණක් දැරිය යුතු බව.

E - මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් වලින් ලබාගන්නා විචාරශීලීත්වයේ අවසාන ප්‍රතිඵලය විය යුත්තේ මාධ්‍ය පාලනය සඳහා ක්‍රියාත්මක වීම බව.

(1) A, B, C

(2) A, B, D

(3) A, B, E

(4) A, B, C, E

(5) A, B, C, D, E

29. 1927 දී "ජනතාව හා ඔවුන්ගේ ගැටලු" යන කෘතිය රචනා කරමින් සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ට දායකත්වය ලබා දුන්නේ,

(1) වෝල්ටර් ලිප්මාන් ය.

(2) විල්බර් ශ්‍රාම් ය.

(3) ජෝන් ඩූවි ය.

(4) ක්ලෝඩ් ෂැනොන් ය.

(5) චාල්ස් කූලි ය.

30. සන්නිවේදන අධ්‍යයනය විෂය ධාරාව ඇතිවීම කෙරෙහි මුල් වූ විෂය ක්ෂේත්‍රය හා ඒ හා මුල් වූ පුද්ගලයින් පහත දැක්වේ.

A - සමාජ විද්‍යාව - චාල්ස් හෝර්ටන් කූලි

B - මනෝ විද්‍යාව - ජෝන් ඩුවි

C - දේශපාලන විද්‍යාව - හැරල්ඩ් ඩී ලැස්වෙල්

D - දේශපාලන විද්‍යාව - වෝල්ටර් ලිප්මාන්

E - ඉංජිනේරු විද්‍යාව - ක්ලෝඩ් ෂැනොන්

ඉහත තොරතුරු අනුව විෂයයන් හා පුද්ගලයින් ඇතුළත් නිවැරදි පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) A, B, C

(2) A, B, D

(3) B, C, D

(4) C, D, E

(5) B, C, E

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

# 1 පාඩම

# 2 පත්‍රය

1. සන්නිවේදනය අත්‍යාවශ්‍ය මානවීය ක්‍රියාවලියකි.

(1) සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ආරම්භ වීම කෙරෙහි බලපෑ කරුණු හතරක් නම් කරන්න.

(ලකුණු 4)

(2) ශ්‍රී ලංකාවේ සන්නිවේදන විෂය ක්ෂේත්‍රයෙහි ඇතිවී තිබෙන සංවර්ධනය හා ඒ ඉගෙනීමෙහි වැදගත්කම කරුණු දෙකක් ඔස්සේ සාකච්ඡා කරන්න. (ලකුණු 8)

(3) සන්නිවේදනය ශාස්ත්‍රීය අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස වර්ධනය කිරීමට දායක වූ විද්වතුන් තිදෙනෙකු පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 12)

(4) සන්නිවේදනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස අධ්‍යනය කිරීමේ වැදගත්කම කරුණු හතරක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 16)

2. (1) රූපවාහිනි මාධ්‍ය භාවිතය ළමයින්ගේ සමාජ සබඳතා දුරස් කිරීමට හේතු හේතු වී ඇති බව පර්යේෂණ මගින් අනාවරණය කර ගනු ලැබූ පාර්ශව දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

(2) සන්නිවේදන අධ්‍යයන විෂයයෙහි සංවර්ධනය සඳහා බලපෑ කරුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

(3) යුනෙස්කෝ සංවිධානය විසින් පාසල් ප්‍රාථමික ශ්‍රේණියේ සිට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය ලබා දිය යුතු බවට නිර්දේශ කිරීමට හේතු වූ කරුණු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(4) 21වන සියවස සඳහා සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය හැදෑරීමේ වැදගත්කම කරුණු හතරක් පදනම් කර ගනිමින් පාසල් ජනමාධ්‍ය සභරාවේ පළ කිරීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

(ලකුණු 16)

3. (1) විල්බර් ශ්‍රාම් විසින් සන්නිවේදන අධ්‍යයනය ශාස්ත්‍රීය විෂයයක් ලෙස ආයතන ගත කිරීමේ දී සිදු කළ වැදගත් මෙහෙවර දෙකක් සඳහන් කරන්න. (ලකුණු 4)

(2) රූපවාහිනී මාධ්‍ය නැරඹීම තුලින් ළමයින් තුල සිදුවන ප්‍රධාන වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

(3) දෙවන ලෝක යුද සමයෙන් පසු "ජනමාධ්‍ය" යන සංකල්පය සංවර්ධනය වීමට හේතු වූ කරුණු තුනක් පිළිබඳ ව විග්‍රහ කරන්න. (ලකුණු 12)

(4) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය විෂය හැදෑරීමේ අවශ්‍යතාව විචාරාත්මක ව කරුණු හතරක් ඔස්සේ විග්‍රහ කරන්න. (ලකුණු 16)

4. (1) සන්නිවේදන විෂය සන්නිවේදන අධ්‍යයනය (communication studies) නමින් ස්වාධීන විෂයයක් වීමට පෙර කුමන විෂය සංකලනයකින් සමන්විත වී ද? (ලකුණු 4)

(2) සමාජය තුළ සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රය ස්වාධීන විෂයයක් ලෙස ගැඹුරින් අධ්‍යයනය කිරීමට පෙළඹ වූ ප්‍රධාන කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 8)

(3) රූපවාහිනි මාධ්‍ය සම්බන්ධයෙන් මහාචාර්ය විල්බර් ශ්‍රාම් ඔහුගේ ප්‍රථම පර්යේෂණ වාර්තාවේ ඉදිරිපත් කළ කරුණු තුනක් විස්තර කරන්න. (ලකුණු 12)

(4) සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය යන විෂයය කොටස් දෙක පිළිබඳ කරුණු දෙක බැගින් යොදා ගනිමින් විස්තර කරන්න. (ලකුණු 16)

5. (1) සන්නිවේදන විෂය ක්ෂේත්‍රයට ඇතුළත් වන පාඨමාලාවක් ප්‍රථම වරට හඳුන්වා දුන් විශ්වවිද්‍යාලය හා එම පාඨමාලාව සඳහන් කරන්න. (ලකුණු 4)

(2) පෙන්සිල්වේනියානු විශ්වවිද්‍යාල පර්යේෂණ කණ්ඩායම විසින් ප්‍රචණ්ඩ ක්‍රියා නරඹන ළමුන්ගේ හඳුනා ගත් ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 8)

(3) සන්නිවේදන අධ්‍යයනයෙහි ආරම්භය හා විකාශය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(4) ශ්‍රී ලංකාවේ සන්නිවේදන විෂයය ක්ෂේත්‍රයෙහි ඇති ව තිබෙන සංවර්ධනය හා එය ඉගෙනීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 16)

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

## 1 පාඩම

## 1පත්‍රය - පිළිතුරු

| | | |
|---|---|---|
| 1. 3 | 11. 3 | 21. 4 |
| 2. 2 | 12. 1 | 22. 1 |
| 3. 2 | 13. 4 | 23. 5 |
| 4. 1 | 14. 2 | 24. 4 |
| 5. 3 | 15. 3 | 25. 5 |
| 6. 3 | 16. 5 | 26. 3 |
| 7. 3 | 17. 4 | 27. 2 |
| 8. 1 | 18. 2 | 28. 1 |
| 9. 5 | 19. 2 | 29. 3 |
| 10. 4 | 20. 3 | 30. 2 |

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

# 1 පාඩම

# 2 පත්‍රය - පිළිතුරු

1.

(1) * ලෝක යුද සමයෙන් පසු තොරතුරු වාර්තා කිරීම සඳහා යොදා ගත් මාධ්‍ය ජනතාව වෙනුවෙන් විනෝදාස්වාදය හා තොරතුරු සම්පාදනය සඳහා යොදාගැනීම.

* යුද්ධයෙන් බිඳ වැටුණු ජනතාවගේ මානසිකත්වය ගොඩ නැගීම සඳහා සරල විනෝදය ගෙන දෙන වැඩසටහන් ඉදිරිපත් කිරීම.

*වාණිජ පරමාර්ථ සඳහා මාධ්‍ය යොදා ගැනීම.

* මාධ්‍ය හිමිකරුවන් හා දේශපාලන නායකයන් විසින් අත්තනෝමතික ලෙස පාලනය කිරීමට පෙලඹීම.

(2) * ජාතික අධ්‍යාපන ආයතනය විසින් 2006 වසරේ දී ප්‍රථම වරට 10 ශ්‍රේණියට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හඳුන්වා දීම.

* 2007 වර්ෂයේ දී 11 ශ්‍රේණියට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හඳුන්වා දීම.

* 2008 වර්ෂයේ දී උසස් පෙළ කලා විෂය ධාරාවට ද සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය විෂය ඇතුළත් කිරීම.

* 1973 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයන අංශයක් ප්‍රථම වරට ආරම්භ කිරීම.

* ලංකා ගුවන් විදුලි සේවය මගින් හා ලේක්හවුස් ආයතනය මගින් වෘත්තීය මාධ්‍යවේදීන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම.

* ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාල රැසක ව්‍යාප්ත ව තිබෙන සහතික පත්‍ර, ඩිප්ලෝමා, සාමාන්‍ය උපාධි, විශේෂ උපාධි, පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි පාඨමාලා දක්වා අධ්‍යයනය කළ හැකි පාඨමාලා ලෙස ඉතා සංවර්ධිත මට්ටමකට පැමිණ තිබීම.

(3) විල්බර් ශ්‍රාම් , හැරල්ඩ් ඩී ලැස්වෙල් , ක්ලෝඩ් ෂැනොන්, වොරන් වීවර්,කර්ට් ලෙවින්, පෝල් ලැසාස්ෆෙල්ඩ්, ජෝර්ජ් ගාබ්නර්

(4) * විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය.

* ගවේෂණශීලී භාවය, විචාරශීලී චින්තනය දියුණු වීම.

* මාධ්‍ය සාක්ෂරතාව.

* යහපත්, ආචාරශීලී හා ඵලදායි මානව අන්තර් සම්බන්ධතා.

* ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සන්නිවේදන ක්‍රියාදාමය හා මාධ්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ අවබෝධය.

* නිර්මානාත්මක චින්තනය හා මාධ්‍ය සන්දේශ නිර්මාණය.

* ජන මාධ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳ අවබෝධය.

* සංවර්ධනාත්මක හා ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයෙන් පෝෂණය වූ පුරවැසියෙකු වීමට අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා හා පුරුදු.

2.

(1) විල්බර් ශ්‍රාම් සහ පෙන්සිල්වේනියානු පර්යේෂණ කණ්ඩායම.

(2) * වාල්ස් කූලි,වෝල්ටර් ලිප්මාන් වැනි විද්වතුන් විසින් කෘති සම්පාදනය කිරිම.

* හිට්ලර් විසින් එරට විශ්ව විශ්වවිද්‍යාල වලින් විශ්වවිද්‍යාලවලින් පිටමං කරනු ලැබූ විද්වතුන් විශාල ප්‍රමාණයක් ඇමෙරිකානු විශ්ව විද්‍යාලවලට කේන්ද්‍ර වී සන්නිවේදන අධ්‍යයන විෂය පිළිබඳව අධ්‍යයනය කිරීම, පර්යේෂණය කිරීම.

* විල්බර් ශ්‍රාම් විසින් සන්නිවේදන අධ්‍යයන ශාස්ත්‍රීය විෂයක් ලෙස ආයතන ගත කිරීම.

(3) * රූපවාහිනිය ඇතුළු ජනමාධ්‍ය සමාජයට ඇති කරන බලපෑම හසුරුවා ගැනීමට.

* මාධ්‍ය පරිහරණයට අවශ්‍ය දැනුමෙන් පුද්ගලයා සන්නද්ධ කිරීමට.

* සමාජය තුළ මාධ්‍ය පරිහරණයට අවශ්‍ය දැනුම ආකල්ප හා කුසලතා වැඩි දියුණු කිරීමට.

* විචාරශීලී ග්‍රාහක පිරිසක් බිහි කිරීමට මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ කුසලතා අත්පත් කර දීමට.

* ජීවිතය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය නිපුණතාවයක් බවට මාධ්‍ය පරිහරණය පත් කිරීම.

(4) * සන්නිවේදන කුසලතා වර්ධනය මාධ්‍ය සාක්ෂරතාව අත්පත් කර ගැනීම.

* විචාරශීලී මාධ්‍ය පරිහරණය අවස්ථෝචිත භාෂා භාවිතය.

* මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ අවබෝධය.

* මාධ්‍යයේ පුද්ගල හා සමාජ බලපෑම පිළිබඳ දැනුම.

* තොරතුරු පරිහරණය, මාධ්‍ය ආචාරධර්ම නිර්මාණශීලී සන්නිවේදන කුසලතා.

* රැකියා ක්ෂේත්‍රයේ ඉල්ලුම වර්ධනය වීම.

* මහජන සම්බන්ධතා නිලධාරී තනතුරු ප්‍රවර්ධනය.

3.

(1) * ජනමාධ්‍ය පාසල් ස්ථාපිත කිරීම.

* සන්නිවේදන පර්යේෂණ ආයතනය ස්ථාපිත කිරීම.

* විශ්වවිද්‍යාල සඳහා නව අධ්‍යයන අංශ ආරම්භ කිරීම.

(2) * වේදනාත්මක දේ පිළිබඳ සංවේදීතාවය අඩු වීම.

* දරුවන් ජීවත් වන අවට පරිසරය පිළිබඳ බියක් ඇති කර ගැනීම.

* අන් අය සමඟ කටයුතු කිරීමේදී ඉක්මනින් ආක්‍රමණශීලී වීම හා ආරවුල් ඇති කර ගැනීමට නැඹුරු වීම.

* රූපවාහිනි ප්‍රවෘත්ති, කාටූන්, චිත්‍රපට, නාට්‍යය ආදී වැඩසටහන් තුලින් ඉදිරිපත් කරන පුද්ගල ඝාතන, සොරකම් , අදෘශ්‍යමාන බලවේග සහිත දේ නැරඹීම.

(3) * සන්නිවේදන තාක්ෂණයේ සිදු වූ ශීඝ්‍ර දියුණුව.

* යුද්ධයෙන් පසු මාධ්‍ය විනෝදාස්වාදය සඳහා ජනතාව වෙනුවෙන් භාවිත කිරීම.

* හිට්ලර්ගේ ඒකාධිපති පාලන සමය තුළ විද්වතුන් බහුතරයක් ඇමරිකාවට සංක්‍රමණය වීම.

* වාණිජ පරමාර්ථ සඳහා මාධ්‍ය භාවිතය.

(4) * සන්නිවේදන කුසලතා වර්ධනය.

* මාධ්‍ය සාක්ෂරතාව.

* නිර්මාණශීලී සන්නිවේදන කුසලතා.

* විචාරශීලී මාධ්‍ය පරිහරණය.

* තොරතුරු පරිහරණය කිරීමේ අවබෝධය.

* යහපත් පුරවැසියෙකු ලෙස සංවර්ධනයට දායක වීම.

* මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ අවබෝධය.

* මාධ්‍ය ආචාර ධර්ම හා නියාමනය පිළිබඳ අවබෝධය.

4.

(1) මනෝ විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව

(2) * සන්නිවේදන තාක්ෂණයේ දියුණුව.

* ජන මාධ්‍යයේ වර්ධනය.

* මාධ්‍ය මඟින් මඟින් සමාජයට එල්ල කළ බලපෑමේ ස්වභාවය.

(3) * රූපවාහිනිය නිසා ළමයින්ගේ සමාජ සම්බන්ධතා දුරස් වන බව.

* තම වේදනාවන් දුරස් කර ගැනීමට භාවිත කරන බව.

* දෙමව්පියන් සමග අඬ දබර ඇති කර ගන්නා දරුවන් නොරිස්සුම් හැඟීම්වලින් පලා යාමට රූපවාහිනිය භාවිත කරන බව.

(4) 1. සන්නිවේදනය

* තොරතුරු හුවමාරුව සන්නිවේදනයයි. සජීවී මෙන්ම සක්‍රීය විෂය ක්ෂේත්‍රයකි.මානව අන්තර් සම්බන්ධතා පැවැත්වීමේ අත්‍යාවශ්‍ය සහ ප්‍රමුඛතම මෙවලමකි.

සන්නිවේදනය පිළිබඳ නිර්වචන, සන්නිවේදනයේ පදනම, කාර්යභාරය, සන්නිවේදන වර්ග, ආකෘති, න්‍යායාත්මක කරුණු, ප්‍රායෝගික භාවිත කුසලතා පිළිබඳ අවධානය යොමු කිරීම යනාදිය මෙම විෂය කොටසට අයත් වේ. මෙම කරුණු දෙකක් විස්තර කළ යුතුයි.

2. මාධ්‍ය අධ්‍යයනය

* විචාරශීලීත්වය යුත මාධ්‍ය පරිහරණය කිරීමට අවශ්‍ය අවබෝධය සහ ශික්ෂණය මාධ්‍ය අධ්‍යයනය මගින් ලබා දෙයි.

* එමෙන් ම මාධ්‍ය සාක්ෂරතාව වර්ධනය කර ගත හැකිය.

* මාධ්‍ය පිළිබඳ ඉගෙනීම හැදෑරීම මාධ්‍ය අන්තර්ගතය මාධ්‍ය ක්‍රියාකාරීත්වය හැඳින්වීම.

* මාධ්‍ය පුද්ගලයාට සමාජයට සංස්කෘතියට බලපාන ආකාරය හැදෑරීම මෙයින් සිදුවේ.මෙම කරුණු දෙකක් විස්තර කළ යුතුයි.

5.

(1) * දෙහිවල කනිෂ්ඨ විශ්වවිද්‍යාලය

* පුවත්පත් කලාවේදය

(2) * වේදනාත්මක දේ පිළිබඳ දරුවන්ගේ සංවේදීතාව අඩු වීම.

* දරුවන් ඔවුන් ජීවත් වන පරිසරය හා අවට ලෝකය පිළිබඳ බියක් ඇති කර ගැනීම.

* අන් අය සමඟ කටයුතු කිරීමේ දී ඉක්මනින් ආක්‍රමණශීලී වීම හා ආරවුල් ඇති කර ගැනීමට නැඹුරු වීම.

(3) * ප්‍රාථමික සමාජයන්හි විසූ ජනයා සිය සරල අවශ්‍යතා ඉටු කර ගැනීමට විවිධ සංඥා, ශබ්ද, සංකේත භාවිත කරමින් අදහස් ප්‍රකාශනය.

* ජනමාධ්‍යය වර්ධනයේ සිට මේ දක්වා කෙටියෙන් පැහැදිලි කළ යුතු ය.

(4) * සමාජ ප්‍රගමනය සඳහා සක්‍රීය දායකත්වය.

* ගවේෂණශීලී භාවය හා විචාරශීලී චින්තනය දියුණු වීම.

* විචාරශීලී ව මාධ්‍ය පරිහරණය කිරීමේ කුසලතා වර්ධනය.

* අවශ්‍ය, අදාළ තොරතුරු තෝරා බේරා ගැනීමට. ( ශ්‍රී ලංකාවට අදාළ ව පැහැදිලි කරන්න)